www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බෝම්බ පිපුරුම ශ්‍රී ලංකාවේ සටන් විරාම ගිවිසුමේ නිල අවසානය සලකුනු කරයි

## Bomb blast marks formal end of Sri Lankan ceasefire agreement

**කේ. රත්නායක විසිනි**
**2008 ජනවාරි 17**

ඊයේ උදෑසන ගිනිකොන දිග ශ්‍රී ලංකාවේ බුත්තල නගරයට ආසන්නයේ දී මාර්ගයක් අසල අටවා තිබූ පැති බෝම්බයක් බස් රථයක් ඉලක්ක කර ගෙන පුපුරා ගියේ අඩු ගනනේ 28කට මරු කැඳවමින් හා 60කට වඩා තුවාල සිදු කරමිනි. කිසිඳු කන්ඩායමක් මේ සම්බන්ධයෙන් වගකීම භාර ගෙන නැති නමුදු, ආන්ඩුව 2002 සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වීමේ සිය තීන්දුව යුක්තියුක්ත කරනු වස් මෙම බෙදවාචකය ගසා කමින් ප්‍රහාරය ගැන දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට වහාම දොස් පැවරී ය. ආන්ඩුව තමන් සටන් විරාමයෙන් ඉවත් වීම පිලිබඳව ජනවාරි 2 දා සති දෙකක කාලයක් දීමෙන් අනතුරුව එය ඊයේ නිල වසයෙන් අවසන් විය.

බුත්තල පිහිටා ඇත්තේ රටේ නැගෙනහිර පලාතට ආසන්නව ය. මිලිටරිය එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශ අල්ලා ගැනීමේ ආක්‍රමනික මෙහෙයුම් මාලාවක් දියත් කිරීමෙන් පසුව ආන්ඩුව පසුගිය වසරේ දී මෙම නැගෙනහිර පලාත “මුදාගත්” ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කලේ ය. දුප්පත් ගම්බද ප්‍රදේශවලින් පැමිනි ගැමියන්ගෙන් බස් රථය පිරී පැවතුනි. ප්‍රහාරකයන් පිපුරුමෙන් පසුව මගීන්ට වෙඩි තබා ඇති බව ඇසින් දුටුවෝ මාධ්‍යවලට පැවසූ හ. පාසල් ලමුන් විශාල සංඛ්‍යාවක් බස් රථයේ සිටි බවට ආරක්ෂක අමාත්‍යංශය නිවේදනය කලත් එකදු ලමයකු වත් ඝාතනයට ලක්ව නැති බව ප්‍රාදේශීය රෝහල් නිලධාරිහු කියා සිටියහ.

තවත් සිදුවීම් ගනනාවක් ම එකකට පසු එකක් වසයෙන් ඉක්මනින් ම සිදු විය. අසල ප්‍රදේශයක දී හමුදා වාහනයකට එල්ල වූ තවත් බෝම්බ ප්‍රහාරයකින් සොල්දාදුවන් සිවු දෙනෙකුට තුවාල සිදු විය. ඉන් මිනිත්තු ගනනකට පසුව කුඹුරක වැඩ කරමින් සිටි ගොවීන් පිරිසකට සන්නද්ධ පුද්ගලයන් කන්ඩායමක් වෙඩි තැබූ බවට වාර්තා වූ අතර ඉන් අඩු ගනනේ පස් දෙනෙක් වත් ඝාතනයට ලක් විය. ඇසින් දුටුවන් පැවසුවේ ප්‍රහාරකයන් හමුදා නිල ඇඳුම්වලට සමාන නිල ඇඳුම්වලින් සැරසී සිටි බව යි. තවත් ප්‍රචන්ඩ ක්‍රියා සිදු වෙතැයි භීතියෙන් නින්දලේ, දඹේයාය හා මිනිපුර වැසියන් ප්‍රදේශය අතහැර දමා පලා යන්ට පටන් ගෙන තිබේ.

ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ බෝම්බ ප්‍රහාරය හෙලා දුටුවේ යඃ “මෙය වනාහි, ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට හා අඛන්ඩතාවට තර්ජනය කරන ඔවුන්ගේ පිලිගත නොහැකි බෙදුම්වාදී එල්ලය හඹා යාමෙහි ලා ත්‍රස්තවාදයට පවත්නා (එල්ටීටීඊයේ) නොවෙනස් කැපවීම ද ප්‍රජාතන්ත්‍රවාදය හා සභ්‍ය හැසිරීමේ සියලු චාරිත්‍රයන් මුලුමනින් ම ප්‍රතික්ෂේප කිරීම ද සමස්ත ලෝකයාට ම ලැජ්ජා විරහිත ලෙස පෙන්නුම් කිරීමකි.”

මිලිටරිය ද සිය ප්‍රචාරක අරමුනු වෙනුවෙන් බෝම්බ ප්‍රහාරය ඩැහැගත්තේ එයට ගොඳුරුවූවන්ගේ ලේවැකි සිරුරුවල ඡායාරූප ආරක්ෂක අමාත්‍යංශයේ වෙබ් අඩවියේ පල කරමිනි. එල්ටීටීඊ සටන්කරුවන් ගොවීන්ට වෙඩි තැබීමෙන් පසුව පලා යනු දුටු බව කියාපාමින් ආන්ඩුවේ ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල සෙසු සිද්ධීන් දෙක සම්බන්ධයෙන් ද එල්ටීටීඊයට දොස් පැවරී ය.

බස් බෝම්බ ප්‍රහාරයෙන් පසුව සිය ගනනක් ප්‍රදේශවාසිහු කෝපයට පත්ව බුත්තල පොලිස් ස්ථානය අසල රැස් වූහ. පිපුරුමට පෙරාතුව අසල කැලෑවේ සැක කටයුතු පුද්ගලයන් සැරිසරන අයුරු තමන් දුටු බවත් ඒ ගැන පොලීසියට දැනුම් දුන් බවත් සමහර ගැමියෝ මාධ්‍යවලට පැවසූහ. පොලීසිය මනා සෝදිසියක් සිදු කිරිමට අසමත් වූ බව කියමින් ඔවුහු පොලීසිය විවේචනය කලහ.

මේ වන තෙක් ප්‍රහාරය සම්බන්ධයෙන් කිසිදු ප්‍රකාශයක් නිකුත් කර නැති එල්ටීටීඊය බස් බෝම්බ ප්‍රහාරය සඳහා වගකිව යුතු පාර්ශ්වය විය හැකි ය. විශේෂයෙන් ම අහිංසක සිංහල සිවිල් වැසියන් ඉලක්ක කර ගෙන එය අතීතයේ දී ඒ සමාන ජන ඝාතක ක්‍රියා සිදු කර තිබේ. එහි ප්‍රකාශ ආරක්ෂක හමුදාවන් විසින් සිදු කරනු ලබන අපරාධ සම්බන්ධයෙන් පුරුද්දක් වසයෙන් සමස්තයක් ලෙස “සිංහල ජාතියට” දොස් පවරයි.

එල්ටීටීඊය 2002 දී සටන් විරාම ගිවිසුම අත්සන් කොට "ජාත්‍යන්තර ප්‍රජාව"ගේ පිටුබලය සහිතව කොළඹ ආන්ඩුව සමග බලය බෙදා ගැනීමේ එකඟතාවක් ඇති කර ගැනීමේ බලාපොරොත්තුවෙන්, වෙනම දෙමළ රාජ්‍ය කැබැලිත්තක් පිලිබඳ සිය ඉල්ලීම අතහැර දැමී ය. සාකච්ඡා ඉක්මනින් ම බිඳ වැටුනු අතර මහ බලවත්තු සටන් විරාමය විවෘතව උල්ලංඝනය කිරීමේ මිලිටරියේ ක්‍රියාකලාපය විවේචනය කිරීම ප්‍රතික්ෂේප කරමින්, පසුගිය වසර දෙක මුලුල්ලේ රාජපක්ෂගේ යලි ඇරඹූ යුද්ධයට වක්‍රව සහයෝගය දුන්හ. නැගෙනහිර පලාතේ ප්‍රදේශවල තම පාලනය අහිමි වීමෙන් පසුව, එල්ටීටීඊය දැන් සිය උතුරේ බල මධ්‍යස්ථානවලට එල්ල වන මිලිටරි ආක්‍රමනවලට මුහුන දී සිටී.

ආරක්ෂක හමුදා සමග සම්බන්ධ වී සිටින එල්ටීටීඊ-විරෝධී සන්නද්ධ කන්ඩායම් බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් වගකිව යුතු වීමට ද ඉඩ ඇත. කලින් වි. මුරලිදරන්ගේ හෙවත් කරුනාගේ නායකත්වයෙන් යුක්ත එල්ටීටීඊයෙන් කැඩී ගිය කන්ඩායමක් නැගෙනහිර පලාත තුල ඔවුන්ගේ රුදුරු විධික්‍රම සම්බන්ධයෙන් කුප්‍රකට ය. කරුනා බලයෙන් පහකර දැමූ එහි නව නායකයාගේ නම අනුව, පිල්ලෙයාන් කන්ඩායම් ලෙස දැන් ප්‍රසිද්ධ මෙම කල්ලිය මිලිටරියේ පිටුබලය සහිතව මුස්ලිම් හා දෙමළ ජනයා අතර වාර්ගික ගැටුම් ඇවිලවීමට උත්සාහ කරමින්. විරුද්ධවාදීන්ට එරෙහි ප්‍රහාරවල නිරත වී තිබේ.

එය කවුරුන් සිදු කලා වුවත් බෝම්බ ප්‍රහාරය ආන්ඩුවේ අත සෘජුව ම ශක්තිමත් කර ඇත. පිපුරුමෙන් පසුව ප්‍රදේශයේ පාසල් වසා දැමුනු අතර කොළඹ ආරක්ෂාව තර කර තිබේ. ආන්ඩුවේ ඇමතිවරු. මිලිටරිය සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි සිංහල අන්තවාදී සංවිධාන වාර්ගික ආතතීන් උත්සන්න කිරීම සහ භීතිජනක හා සන්ත්‍රාස මනෝගතියක් නිර්මානය කරනු වස් ප්‍රහාරය යොදා ගති.

සති අන්තයේ දී ජපානයේ විශේෂ නියෝජිත යසුසි අකාෂි විසින් කොළඹ දී පල කරන ලද තරමක් ඇල් මැරුනු උත්සුකතා වෙතින් අවධානය වෙනතකට යොමු කරනු වස් බෝම්බ ප්‍රහාර ප්‍රයෝජනවත් වී තිබේ. රාජපක්ෂ මුන ගැසුනු අකාෂි කියා සිටියේ සටන් විරාමයේ අවසානය ප්‍රචන්ඩ ක්‍රියා හා සිවිල් වැසියන් මියයාම උත්සන්න වීමට තුඩු දෙනු ඇතැයි තමන් කනස්සල්ලට පත්ව ඇති බව යි. සටන් විරාමයෙන් ඉවත් වීමේ ආන්ඩුවේ තීන්දුව හමුවේ ජපානය සිය ආධාර වැඩපිලිවෙල යලි සලකා බැලීමට ඉඩ ඇතැයි ඔහු ඇඟවී ය. ශ්‍රී ලංකාවේ විශාලතම ආධාර දායකයා වන ජපානය එක්සත් ජනපදය, යුරෝපා සංගමය හා නෝර්වේ හා එක්ව ඊනියා සාම ක්‍රියාදාමයේ සම-සභාපතිවරු ලෙස ක්‍රියා කරයි.

සාම ක්‍රියාදාමයේ නිල පහසුකම් සලසන්නා වන නෝර්වේ ද ඊට සමාන උත්සුකතා ප්‍රකාශයට පත් කර ඇත. සටන් විරාම ගිවිසුම අධීක්ෂනය කල නෝර්වේජියානු නායකත්වයෙන් යුක්ත ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්), ඊයේ සිය කාර්ය මන්ඩලය රටෙන් ඉවත් කර ගත්තේ ය. එල්ටීටීඊයට පක්ෂපාතී ලෙස ක්‍රියා කරන්නේ යැයි ජවිපෙ හා සෙසු සිංහල ස්වොත්තමවාදී කන්ඩායම් නෝර්වේ තියුනු ලෙස විවේචනය කර තිබේ. එස්එල්එම්එම් ප්‍රධානි ජොහන් සොල්බර්ග් යලි සාම සාකච්ඡා අරඹන ලෙසත් දිගු කාලීන යුද්ධයට සාකච්ඡාමය දේශපාලන විසඳුමක් සොයා ගන්නා ලෙසත් ඉල්ලා සිටියේ ය.

සටන් විරාමය අවසන් වීම ගැන තමන් "අපහසුතාවට" පත්ව ඇතැයි ප්‍රකාශ කල බුෂ් පාලනාධිකාරය එහෙත් සාම සාකච්ඡා යලි අරඹන ලෙස බල කිරීමට කිසිදු පියවරක් ගෙන නැත. යථාර්ථය නම්, එල්ටීටීඊය තදබල ලෙස විවේචනය කර ඇති හා ශ්‍රී ලංකාවෙට මිලිටරි ආධාර සපයා ඇති එක්සත් ජනපදය රාජපක්ෂ ආන්ඩුව යලි යුද්ධය ඇරඹීම සඳහා දිරිගැන්වීමෙහි ලා ප්‍රධාන සාධකයක් ලෙස ක්‍රියා කර ඇත යන්න යි. සටන් විරාමයෙන් ඉවත් වීමේ ආන්ඩුවේ තීන්දුවෙන් අනතුරුව එෆ්බීඅයි සංවිධානය සිය වෙබ් අඩවියේ පල කල ප්‍රකාශයකින් එල්ටීටීඊය "ලෝකයේ අතිශයින් ම භයානක හා මිනීමරු අන්තවාදී සංවිධාන අතරින්" එකක් ලෙස නම් කර තිබීම අර්ථභාරී ය.

සටන් විරාමයේ බිඳවැටීම සිදු වූයේ ජවිපෙ සහයෝගය සහිතව 2005 ජනාධිපතිවරනයෙන් රාජපක්ෂ යන්තම් ජය ගැනීමෙන් අනතුරුව ය. මිලිටරියේ තත්වය ශක්තිමත් කරනු වස් 2002 සටන් විරාම ගිවිසුම යලි සාකච්ඡාවට භාජනය කිරීම ඔහුගේ මැතිවරන පොරොන්දුවලට ඇතුලත් විය. එය වනාහි මොන යම් හෝ අනාගත සාම සාකච්ඡාවක් තථ්‍ය වසයෙන් බිඳ දැමීමේ පියවරක් විය. රාජපක්ෂ බලයට පත්වී මඳ කලක් ගතවීමට පෙරාතුව ම, මිලිටරියත් කරුනා කන්ඩායම වැනි එයට සම්බන්ධිත පැරා-මිලිටරි කල්ලිත් එල්ටීටීඊය දුර්වල කිරීමේ ද එය ප්‍රතික්‍රියාවන්ට පොලඹවා ගැනීමේ ද එල්ලයෙන් යුක්ත කැත අවෘත යුද්ධයක් දියත් කලහ.

2006 ජුලි මාසයේ දී, එල්ටීටීඊ-පාලිත මාවිල්ආරු ප්‍රදේශය අල්ලා ගැනීමට ආක්‍රමනික මෙහෙයුමක් දියත් කරන ලෙස රාජපක්ෂ මිලිටරියට අන කලේ ය. මෙය වනාහි සටන් විරාමය විවෘතව ම උල්ලංඝනය කිරීමක් වූ අතර එයට එරෙහිව කිසිදු ජාත්‍යන්තර විවේචනයක් එල්ල වූයේ නැත. මෙම මෙහෙයුම සඳහා කඩතුරාව වූයේ ජල මාර්ගය පහළ ප්‍රදේශයේ ගොවීන්ට ජල සැපයුම කපා හරිමින් මාවිල්ආරු වාරිමාර්ග සොරොව්ව

වසා දමමින් එල්ටීටීඊය දැක්වූ විරෝධතාවකි. මාවිල්ආරු මෙහෙයුම නැගෙනහිර පලාතෙන් එල්ටීටීඊය පලවා හැරීමේ එල්ලයෙන් යුක්තව සැලසුම් කල ආක්‍රමනික මෙහෙයුම් මාලාවක පලමු වැන්න පමනක් වූ බව ඉක්මනින් ම පැහැදිලි විය.

පසුගිය වසර දෙක මුලුල්ලේ පැවැති යුද ගැටුම්වලින් 5,000ක් පමන මරනයට පත්ව සිවිල් වැසියන් 200,000ක් පමන සිය නිවාසවලින් පලවා හරිනු ලැබ ඇතැයි තක්සේරු කෙරේ. බොහෝ දෙනෙක් මිලිටරියේ සිත්පිත් නැති ගුවන් හා කාලතුවක්කු ප්‍රහාරවලට ගොදුරු වූහ. එමෙන් ම, ප්‍රාදේශීය ජනතාවන් ත්‍රස්ත කිරීමේ තවත් ප්‍රයත්නයක් ලෙස මිලිටරිය හා එයට සම්බන්ධිත පැරා-මිලිටරි කන්ඩායම් සිය ගනනක් ජනයා, බොහෝ සෙයින් දෙමල ජනයා, පැහැර ගැනීමට හා ඝාතනයට ලක් කර ඇති බවට සැලකිය යුතු පරවේශනීය සාක්ෂ්‍ය පවතී. සටන් විරාමයෙන් නිල වසයෙන් ඉවත් වීමේ තීන්දුව ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියාදාමයේ මිනී පෙට්ටියට අවසන් ඇනය ගැසීමක් පමනි.

දිවයිනේ 25 වසරක සිවිල් යුද්ධය යලි ඇරඹීම ද එනයින් ගත් කල යලි ඇරඹූ යුද්ධය දැනටමත් නිර්මානය කර ඇති තවත් බොහෝ ඛේදවාචකයන් ද සමග ඊයේ බස් බෝම්බ ප්‍රහාරය ද සම්බන්ධයෙන් රාජපක්ෂ ආන්ඩුව දේශපාලනිකව වගකිව යුතු ය.

© www.wsws.org